# ශ්‍රී මහා බෝධීන් වහන්සේ සහ වන්දනාකරුවන් හා බැඳි ජනශ්‍රැතිය

තිස්ස බණ්ඩාර

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ බෝධි සංස්කෘතිය හා සම්බන්ධ සාහිත්‍යයක් ලියැවී තිබෙයි. දැනට වසර දෙදහස් තුන්සියයකට පමණ පෙර සිට පැවත එන්නා වූ උක්ත සංස්කෘතියට අදාළ සාහිත්‍යය කෙතරම් ද යනු නිශ්චිත නැත. වංසකථානුගත තොරතුරු සහ සෙසු සාහිත්‍යය ද ඇතුළත්ව මෙකී සාහිත්‍යය විවිධ කාලසීමාවන්හි දී නිර්මාණය ඇති බවට සාධක යම් තරමක් දක්නට ඇත. ඇතැම් ඒවා අදෘශ්‍යමාන ය. බොහෝ සාහිත්‍යය ඇසුරු කරගෙන විවිධ පර්යේෂණ විවිධ අය විසින් සිදුකරනු ලැබී ය. ඇතැම් ඒවා මුද්‍රණයෙන් ද පළව ඇති බව පෙනී යයි. ඒ අනුව ශ්‍රී මහා බෝධි සංස්කෘතිය පිළිබඳ ව සාරගර්භ නිබන්ධ රචනා වීම මෙම ක්ෂේත්‍රයේ කැපී පෙනෙන ලක්ෂණයකි.[1] මෙය එක් නිදසුනක් පමණි. එහි නිබන්ධක මෙසේ දක්වා තිබෙයි. "දෙවන පරිච්ඡේදයේ අපේ අවධානයට මූලික වශයෙන් පාදක කරගන්නා ලද මූලාශ්‍රය පිළිබඳ හැඳින්වීමකි. එම පාදක ග්‍රන්ථ හා බෝධි සාහිත්‍යය ට ඇතුළත් සියලු ම කෘති පිළිබඳ විස්තර ප්‍රකට ව ඇති හෙයින් ඒවා ඉතා සංක්ෂිප්තව හඳුනා ඇත."යනුයි.[2] ඒ අනුව එකී මූලාශ්‍රය මෙසේ ය. දීපවංසය, මහාවංසය, සමන්තපාසාදිකා, සාරත්ථදීපනී, වංසත්ථප්පකාසිනී, පූජාවලිය, පාලි බෝධිවංසය, බෝධිවංස ටීකාව, මහා බෝධිවංස ග්‍රන්ථපද විවරණය, ධර්මප්‍රදීපිකාව, සිංහල බෝධිවංසය, චූල බෝධිවංසය යන සාහිත්‍ය කෘතීන් ය.[3] මෙම නිබන්ධයේ සඳහන් පරිදි බෝධි සංස්කෘතිය පිළිබඳ ව ඇති සියලු ම සාහිත්‍ය යන්න කෙරෙහි අවධානය යොමු කිරීම අනුව එකී සියලු ම සාහිත්‍ය කෘති මෙහි අන්තර්ගත ද යන්න ප්‍රශ්නාර්ථයක් විය. එමෙන් ම ඉහත මාතෘකාව අනුව ලිපියක් සැපයීමට ලද ආරාධනය අනුව තොරතුරු සෙවීම පිණිස එකී සාහිත්‍ය කෘති පරිශීලනය කළේ වූයේ වුව ද ප්‍රමාණාත්මක ව වන්දනාකරුවන් පිළිබඳ තොරතුරු අන්තර්ගත නොවන බව පෙනී ගියේ ය. බෝධිය හා බැඳුණු බොහෝ විස්තර ඒවායේ ඇතුළත් ව ඇතත් වන්දනාකරුවන් පිළිබඳ තොරතුරු අල්ප ය. එහෙයින් මේ පිළිබඳ ව තව දුරටත් පරීක්ෂාවේ නිරතවීමට සිදුවිය.

---

ධම්මරක්ඛිත හිමි, වැලිවිටියාවේ, ශ්‍රී මහා බෝධීන් වහන්සේ ඉතිහාසය හා තදනුබද්ධ සංස්කෘතිය, බුද්ධශාසන අමාත්‍යාංශය කොළඹ, 1994.

එම, VI පිට.

එම, 21 -28 පිටු.

**විමර්ශනය**

ලංකාවේ වංසකතා අතර පැරණිතම මූලාශ්‍රය සේ සැලකෙන දීපවංසයෙහි බෝධිවන්දනාකරුවන් පිළිබඳ ව එක් ගාථාවකින් තොරතුරක් අන්තර්ගත ය. වන්දනාකරුවන් පැමිණි මාර්ග පිළිබඳ ව මෙම කෙටි ලිපියෙන් යමක් සඳහන් කිරීමට අදහස කෙරෙන හෙයින් එය මෙහි බහාලනු ලැබෙයි. එනම්,

"අනුරාධපුරා රම්මා නික්ඛමිත්වා බහුජනා,
සම්බෝධිං උපසංකත්තා සහ දේවේහි ඛත්තියා."[4]

මෙහි අදහස වන්නේ "එකල්හි රජුන් සහිත රාජමහේෂිකාවන් හා බොහෝ ජනයෝ ද රම්‍ය වූ අනුරාධපුරයෙන් නික්ම බෝධිය වෙත එළඹියාහු ය" යනුයි. දීපවංස තොරතුරු අනුව 'අනුරාධපුරයෙන් නික්ම' යන්න කෙරෙහි අවධානය යොමුකළ යුතුව ඇත. බෝධීන් වහන්සේ රෝපනය කළේ ද අනුරාධපුරයේම ය. එසේ නම් රජු ඇතුළු පිරිස අනුරාධපුරයෙන් නික්ම කොහි ගියාහු ද? යනු ප්‍රශ්නයකි. මෙහි දී තෝරා බේරාගත යුත්තේ 'අනුරාධපුර' යන්නෙන් එසමයෙහි ව්‍යවහාර වන්නට ඇත්තේ රාජකීය පුරය වූ ඇතුළු නගරය යි. එය අනුරාධ ඇමති විසින් පුරාණයේ දී ආරම්භ කළ නගරයයි. එසේ නම් මෙම පුරයෙන් හෙවත් එකී නගරයෙන් රජු පිටත් ව ඇත්තේ එහි දකුණු දොරටුවෙන් බැහැරට ය. එහි සිට දකුණු දිශාවට වන්නට වූ ගමන් මග දිගේ යාර පන්සියයක් පමණ ගිය තැන උතුම් වූ බෝධිය පිහිටුවන්නට සුදුසු ස්ථානය වන්නට ඇත. එසේ නම් බෝධිවන්දනාව පිණිස පැමිණි වන්දනාකරුවන් අතුරින් දෙවනපෑතිස් නිරිඳු ප්‍රමුඛ පිරිස ඇතුළුනගරයේ දකුණු දොරටුවෙන් පිටත්ව දකුණු දිගට ඍජුව ඇති (වර්තමාන ස්වර්ණමාලි) මාවත වන්දනාකරුවන්ගේ පැරණිතම ගමන්මග හැටියට සටහන් වන්නේ ය. රජුගේ පැමිණීමට පසුව පැමිණි පිරිස පිළිබඳ ව දීපවංස කතුවරයා මෙසේ දක්වයි.

පරිවාරයිංසු සම්බෝධිං සහ පුත්තේහි ඛත්තියා,
ගන්ධ මාලාව පූජේසුං ගන්ධ ගන්ධාන මුත්තමං.
වීථියොච සුමට්ඨ අග්ඝියෝච අලංකතා,
පතිට්ඨිතෙ බෝධිරාජෙ කම්පිත්ත පඨවිංතදා.[5]

'පුත්‍රයන් සහිත වූ ක්ෂත්‍රියයෝ උතුම් බෝධිය පිරිවැරූහ. සුවඳ වර්ගයන් අතුරෙන් උතුම් වූ සුවඳ වර්ග හා සුවඳ මල් මාලාවන් බෝධියට පිදූහ. නාගරිකයන් විසින් නගරවීථිහු මොනවට හමදනා ලද්දියෝ ය. එසේ ම තන්හි තන්හි අත්‍යලංකාර තොරන් පන්තීහු නොහොත් මල් ඇගෑකරණ ලද්දියෝ වූහ. බෝධිරාජයන් පොළොවෙහි පිහිටි කල්හි පොළෝ කම්පිත වූවා ය' යනු එම ගැට දෙකෙහි අර්ථයි. මෙයින් පෙනී යන්නේ බෝධිය රෝපනය කිරීමට පෙර ඒ අය වන්දනාව පිණිස මෙහි පැමිණි බවයි. එමෙන් ම වෙනත් මූලාශ්‍රවල දැක්වෙන පරිදි මෙහි ජම්බුකෝල පට්ටනයෙ හි(දඹකොළ පටුන) මුහුදට පිවිස රජු බෝධිය පිළිගත් බවක් නොදැක්වෙයි.

මහාවංස පුවතට අනුව දෙවනපෑතිස් රජු දඹකොළ පටුනේ සිට බෝධිය අනුරාධපුරයට ගෙනවිත් උතුරු දොරටුවෙන් පුරයට ප්‍රවේශ ව බෝධිය සමඟින් ම දකුණු

4 සිංහලානුවාද දීපවංසය, සංස්. කිරිඇල්ලේ ඤාණවිමල හිමි, සීමාසහිත ගුණසේන සහ සමාගම, ද්විතීය මුද්‍රණය, කොළඹ, 1970, 82 පිට.

5 සිංහලානුවාද දීපවංසය, 82 පිට.

සිද්ධ ශ්‍රීමා බෝධි සාමි අනුරපුරයේ පිහිටි බලයෙනි
සුද්ධ සොඳ මල්පහන් දුම්මල ඔබට පූජා කළේ සාමිනි
වද්ද නොදී මේ කරපු පව්කම් නොතිබුනත් ගෙවීයයි ඉතිකිනි
සිද්ධ වී අපි කරපු සැම පින් රන් පොතේ මැද අදම ලියමිනි

විස්ත්‍ර අගපත් සඳුන් දුම්මල ඔබට පූජා කළේ සාමිනි
පත්‍ර සහ මතු උපන් ජාතිය නිපුන වෙන්නට පතා වැන්දෙනි
පත්‍ර දළු ලියලතා විලසට කළ කුසල් මේ පිරිතෙ බලයෙනි
චක්‍රවර්තී රජව ඉපදී සුසැට ධර්මෙන් රට ද කරමිනි

අමා ගුන ඇති සතට සෙත දෙන සිරිමා බෝ බෝධි සාමිනි
නමා සිරසය වැටීදන ඇන දෝත නලලේ තබා වඳිමිනි
මෙමා කළ පවු ගෙවා යන්නට ආමි සැපදෙන ඔබගෙ බලයෙනි
පමා නොමකළ කුසල් මතු වී රන් පොතේ ලියවන්ඩ සාමිනි

තඹෙන් ලෝකඩවලින් ඉටියෙන් රනෙන් මැනිකෙන් පිළිම කරමිනි
උතුන් අපගේ ලොවුතුරා නම් බුදුන් දුටු ලෙස වඳිති සතුටිනි
සොඳින් ඒ අනුරපුරයේ උතුන් ශ්‍රීමා බෝ පිහිටි බලයෙනි
එයින් පවතින මෙවෙනි පිරිවර එලෙස වඳිමුව සතොසිනි

මහසන් පෝයට සිළිරකිනා බෝ
අකුනු විදුලි ලෙස පැන නැගුනා බෝ
ලකුණු බලා සිට ෂලකරනා බෝ
ලකුණු දිවස ඇති ජය ශ්‍රී මා බෝ

නම්බු රජකත මැද වැඩියයි බෝ
කොම්බු නලා හොරණෑ පිඹිනැ බෝ
තොංගු වෙලා වැඩියයි අහසින් බෝ
දැක ගුවනින් වැඩියයයි සිරිමා බෝ

පින්ගන්ඩේ ලොව සත රකිනා බෝ
ඉන්සන්ඩේ උඩ සිටිනා බෝ
රන්මණ්ඩේ පිට වැඩ සිටිනා බෝ
අම්මණ්ඩිය වඳිව් ශ්‍රී මා බෝ

දකුණු අතට පය ජයමකුලා බෝ
අකුණු විදුලි ලෙස පැන නැගුනා බෝ
ලකුණු බලා සිට සලකුණු කළ බෝ
ලකුණු දිවස් ඇති ජය ශ්‍රී මා බෝ

විඳිය බැස පහුරට නැගුනා බෝ
පමණය කළපින් මතු දැකලා බෝ
බෝදියකට බුදුගුන පවතින බෝ
බෝදියපිට වැඩියයි ශ්‍රී මා බෝ

ලැබී තිබෙන කය කය දැකලා බෝ
එදී එරන් කෙඳි ඇදලා බෝ
දිදී සාදුකාරත් වඳිමුව බෝ
සැදී පේලි වඳිමුව ශ්‍රී මා බෝ

ඉස්සර එන කල දිවසින් දුටු බෝ
රස්කර මිනිමුතු කුඩයක පිට බෝ
අත්හැර පස්පවු දුරුකරනා බෝ
විස්තර වැලි මළුවට වැඩියයි බෝ

එතරින් වෙහෙරට ගුවනින් වැඩි බෝ
මකරෙන් කුම්බෙන් මීනෙන් වැඩි බෝ
සසරෙන් ගොඩලා සතරකිනා බෝ
ඉසුරෙන් සෙත් දෙන් ජයශ්‍රීමා බෝ

යුදද කරන්නට වසවතු ආ බෝ
වද්ද නොදී උන් මුනි දිනනා බෝ
යුදද මරුන් දැකලා ලෙලදුන් බෝ
සුදදවෙලා වඳිමුව ශ්‍රීමා බෝ

දෙතනේ රත්රන් කිරි එරෙනා බෝ
කොතනේ වඳතත් වට සිටිනා බෝ
නිතිනේ සවුසිරි සතරකිනා බෝ
හිතුනේ වඳිනට යමු ශ්‍රී මා බෝ

චන්ද්‍රරුව මණ්ඩලටම සිටි බෝ
ඉන්ද්‍රනීල මැණික් බබලන බෝ
පත්ම වර්ණකර දලු ලියන බෝ
සිරස නමා වඳිමුව ශ්‍රී මා බෝ[12]

පද්‍යය දහහතකින් සමන්විත සිරි මා බෝ කවි පද්‍යාවලිය තාඹුගල ශේකුරු නයිදෙ විසින් රචනා කරන ලද්දකි. මෙම තාඹුගල ශේකුරු නයිදෙ මාතර යුගයේ සිංහල කාව්‍ය ප්‍රබන්ධ කළ අය අතර වන්දනා කවි ලියූ අයෙකි. මාතර යුගයේ සිංහල කාව්‍ය පිළිබඳ ව මෙසේ විස්තර වෙයි. "එවක විසූ ලේඛකයන් හුඟ දෙනෙකුගේ වැඩ කටයුතුවලට කේන්ද්‍රස්ථානය වූ මාතර නගරයේ නාමය උපයෝගී කරමින් වර්ෂ 1720ට හා 1830ට අතර ඇති වූ සාහිත්‍ය කෘති සමූහයා හඳුනාදීම පිණිස මාතර සාහිත්‍ය කියා ව්‍යවහාර කරන්නේ පළාතක පමණක් නොව මුළු සිංහල රටේ ම මේ කාලසීමාව තුළ ඇති වූ ලේඛනය ඒ ව්‍යවහාරයට අහුවෙන හැටියටයි. මාතර පමණක් නොව කොළඹ හා මහනුවර ද වන්නිය හා ඌව වැනි දුරබැහැර පළාත්වල ද රසවත් කවි ප්‍රබන්ධ මේ කාලයේ දී රචනා කරන ලද්දේ ය."[13]

දැනට ආසන්න වශයෙන් වසර තුන් සියයකට පමණ පෙර ලියන ලද මෙම කාව්‍ය පන්තිය අනුව එසමයෙහි සිරිමා බෝධීන් වහන්සේ පිළිබඳ ව කවි රචකයින් අතර තිබුණු ජනශ්‍රැතිය හෝ ජන විඥානය යම් තරමක් ප්‍රකට කරයි. පුස්කොළ පිටපතකින් උපුටා ගන්නට ඇතැයි සිතිය හැකි මෙම කවි පන්තියේ පළමු වැනි කවියෙන් ඍධියෙන් බෝධිය වැඩමකළ බව කියැවෙයි. එහි ඍදධි යන්න 'එද්දි' ලෙස ලියා තිබෙයි. බෝධීන් වහන්සේ හඳුන්වා ඇත්තේ 'බෝධි සාමි' වශයෙනි. 'සාමි' යන්න ද්‍රවිඩ පදයකින් පැවත එන්නේ යැයි සිතිය හැකි ය. එකී සමය නරේන්ද්‍රසිංහ රජුගේ සමයට සම්බන්ධ වෙයි. එ සමයෙහි මහනුවර හා ඒ ආශ්‍රිත ද්‍රවිඩ ව්‍යවහාරය තිබුණු බවට තවත් සාධක පවතී. ශේකුරු නයිදෙ "මම වඳන් මතු නිවන් දක්නට පිහිට සිරිමා බෝධි සාමිනි" යනුවෙන් පළමු පද්‍යයේ සතරවැනි පැදයෙන් කියයි. එහි දෙවැනි කවියෙන් කියැවෙනුයේ සස ජාතකය සිහිපත් කරමිනි. සසව උපන් බෝසත් තුමා ගිනි මැලයට පැන දිවි පිදීම දාන පාරමිතාවේ එක් අවස්ථාවකි. එහි එන බෝසත් තුමාට සිරිමා බෝධීන් වහන්සේ උපමා කිරීම මෙහි දැක්වෙයි. එයට අනතුරුව කවියෙන් ශේකුරු නයිදෙ පවසා ඇත්තේ ඔවුන් කළ සියලු පින් එදින ම රන් පොතේ ලියූ වගයි.

සිවුවැනි පද්‍යයෙන් ප්‍රාර්ථනාවක් කරන සෙයක් පැනෙයි. එනම්, සුවඳ දුම් ආදිය පූජා කරමින් මතු උපදින ජාතියේ දී නිපුණ වන්නට කරන ප්‍රාර්ථනයකි. එමෙන් ම බෝධි පත්‍ර දළු ලා ලියනන පරිදි කුසල් වැඩෙන්නට ද එම ප්‍රාර්ථනාවට ඇතුළත් ය. අවසානයේ චක්‍රවර්ති රජව සූසැට ධර්මයෙන් රට ද කරමි යන බලාපොරොත්තුව ද එහි ම කියැවෙයි.

පස්වෙනි පද්‍යයෙන් කතුවරයා කියනුයේ අමා ගුණ ඇති බෝධීන් වහන්සේ වෙත සිරස නමා දන ඇන දෝත නලලත තබා වැඳීමත් ඔහු කළ පවු සමාකරගන්නට පැමිණි බවත් ය. එමෙන් ම ඔහු ප්‍රමාදයකින් තොරව නිමකළ කුසල් රන්පොතේ ලියනු මැනවි යන ඉල්ලීම ද සිරිමහ බෝධීන් වහන්සේගෙන් ඉල්ලා සිටියි.

---

12 සෙනෙවිරත්න, නි. බ. මා. සිංහල කාව්‍ය සංග්‍රහය මාතර යුගය, ජාතික කෞතුකාගාර ප්‍රකාශන, කොළඹ, 1964, 213-214 පිටු.

13 එම, 111 පිට.

සයවෙනි පද්‍යයෙන් තඹ, ලෝකඩ, ඉටි, රත්‍රන්, මැණික්වලින් පිළිම කරන බවත් ලොවුතුරු බුදුන් වහන්සේ වඩින සෙයින් ම මහ බෝ වඩින බවත් කියා සිටියි. අනුරපුර සිරිමා බෝධි බලයෙන් පවතින පිරිවර එසේ වඩින බව කියා සිතන්නට මෙම කවියා උත්සාහගෙන තිබෙයි. සත්වෙනි පද්‍ය ඉහත පද්‍ය පහට වඩා පද ප්‍රමාණයෙන් අඩු මෙන් ම දිගින් අඩු පද්‍යයකි. ඉන් පහළ ඇති සෙසු පද්‍ය ද එලෙස ම ය. මහසත් පෝයට සිලි සමාදන් වූ ලෙසින් බෝධීන් වහන්සේ සිටින අයුරුත් බෝධීන් වහන්සේට දිවැස් ඇති අයුරුත් සත්වෙනි කවිය තුළින් කියැවෙයි. අටවෙනි පද්‍යයෙන් බෝධීන් වහන්සේගේ ප්‍රාතිහාර්ය බලයක් පෙන්වයි. ඒ 'ගුවනින් වැඩි බෝ' යනුවෙනි. මෙම පද්‍යයේ 'තඹු, කොඹුනලා, තොගුවෙලා' යන පද තුන නම්ඹු, කොම්ඹු, තොංගු ලෙස උච්චාරණය කළ යුතුය. එවකට පුස්කොළ ලේඛනය තුළ 'ම්' කාරය ලියුවේ නැත. සම්බුද්ධස්ස යන තැන 'සඹුද්ධස' වශයෙන් ලියවීම තවත් නිදසුනකි. මේ ආකාර ලේඛන ක්‍රම අනුව ද මෙහි මුල් පිටපත අවුරුදු තුන්සීයක් පැවත එන බව විශ්වාස කළ හැකි ය.

නවවෙනි පද්‍යය තුළින් ලෝක සත්වයා බෝධීන් වහන්සේ විසින් රකිනා ලද බව කියයි. මෙහි ඇති ඉත්සන්ඩේ සහ රත්මන්ඩෙ යන වචන සමකාලීන සිංහලයේ ස්වරූපය පෙන්වයි. මෙහි සඳහන් සිවැනි පාදයෙන් "අම්මණ්ඩිය වදිමි ශ්‍රීමා බෝ" යන්න දැක්වීමෙන් පෙනීයන්නේ තම බිරිඳට ශ්‍රීමා බෝ වඳිනා බව කියා පෑමකි. අම්මණ්ඩි යනු ඇතැම් තැනක බිරිඳට කියන තවත් නමකි. සෙසු කවිවලින් මේ බෝරජුගේ ප්‍රාතිහාර්ය ගති තව ද විස්තර වෙන අතර පොදුවේ ශ්‍රීමා බෝධිය වැඳීම සම්බන්ධයෙන් භක්ති ප්‍රණාම දක්වා සිටියි. මේ ආකාර පද්‍ය පංති තුළින් සමකාලීන ජන ව්‍යවහාරය මෙන් ම ජනශ්‍රුතියට ඇතුළත් ඇතැම් තොරතුරු ද දැන ගැනීමට හැකියාව ඇත. මෙකී පද්‍ය පංතියේ මුල් පිටපත කුමන තැනක ඇත්දැයි, අදාළ මූලාශ්‍රය තුළ දක්නට නොවීම අඩුවකි. ඇතැම් විට ජාතික කෞතුකාගාරය සතුව ඇතැයි අනුමාන කරමු.

බෝධි වන්දනා මැයෙන් පත්ඉරු දහයකින් යුත් තවත් පුස්කොළ පිටපතක් කොළඹ ජාතික කෞතුකාගාරයේ තිබෙයි. අඟල් $1 \times {}^{1}/_{2}$ ප්‍රමාණයේ එම පිටපත ක, කා ක්‍රමයෙන් පත්තිරු අංකනය කැර ඇත. අඟලකට අකුරු තුන ප්‍රමාණයෙන් යුක්ත ව සිංහල අකාරයෙන් ලියන ලද එකකි. එහි ආරම්භක පද්‍ය දෙක සහ අවසන් පද්‍ය දෙක මෙසේ ය.

සැනෙක දිනේ ඉරුදැල් ඇලු බෝ
දන්ත ධා තුල වැඳගත් බෝ
පෙනෙයි දුරට කොත් දිලිසෙන බෝ
අනේ වඳින්නට යමු සිරිමා බෝ

දෙතනේ රසකිරි බී ඇති උන බෝ
කොතනක උනත් බුදුන් දකින බෝ
සත්තෙ සව්සිරි සත රකිනා බෝ
සිත් සේ වඳිනට යමු සිරිමා බෝ

අවසන් පද්‍ය දෙක මෙසේ ය,

තුන්සිත පාදා පින්කර ගං ටයි
බයා දුකක් කිසි කලෙක නෙවං ටයි
අහිපතක් කිසි කලෙක නොවං ටයි
බයාගිරියෙ වෙහෙරත් වැඳගන් ටයි

අශ්න මුදුනෙ සැඩ සිටි එදි නෙ
නොලසි දගොස් බැඳ පුළු එන නෙ
සතොසි තුංකල් දනිමුව ගින නෙ
එගොසිං වැඳපිමු අටමස්ථා නෙ[14]

මෙම පදය පන්තිය තුළින් ද කියැවෙනුයේ සිරිමා බෝ වඳින්නට යෑම සම්බන්ධයෙනි. සිත් සේ වඳිනට යමු සිරිමා බෝ'යන්නෙන් කවියා සිය අදහස මෙහි දෙවන කවියෙන් කියා සිටියි. අවසානයට ඇත්තේ සිරිමා බෝධිය පමණක් නොව 'අටමස්ථානය වැඳ දැකබලා ගන්නට යමු' යන අදහස ඇති බලාපොරොත්තුවයි.

තවත් පත්තිරු 13ක් සහිත 'බෝධිවන්දනා' පුස්කොළ පිටපතක ආරම්භය මෙසේ ය.

නමෝ නමෝ බුද්දධ දිවාකරා ය
නමෝ නමෝ ගෝතම චන්දිමා ය
නමෝ නමෝ ත්‍රන්ත ගුණ්ණණවා ය
නමෝ නමෝ ශාඛ්‍ය නන්දනා ය

බුද්ධං ධම්මං සංඝං සුගත තනුභවො ධාතුයො
ධාතු ගබ්බෙ ලංකායං ජම්මුදීපෙ
තිදසපුර වරෙ නාග ලෝකේච ථූපෙ සබ්බේ
බුද්ධස්ස බිම්බෙ සකල දස දිය කේස
ලෝමාදි ධාතුං වන්දෙ සබ්බේපි බුද්ධං
දසබලතනුජං බෝධි චෛත්‍යං නමාමි

අට විසි මුනිඳු පෙල
බුදුව වැඩසිටි බෝ මුල
නිවරද එපිලි වෙ ල
කියා වඳිමුව එජය බෝ මුල

---

DE SILVA, W. A., MEMORIS OF THE COLOMBO MUSEUE: Catalogau of Plam Leaf Manuscripts. Vol. I, Ceylon Government Press, Colombo. 1938, P. 139.

එහි අවසාන පද්‍ය තුන මෙසේ ය,

| | |
|---|---|
| මෙ ලක්දිවේ අනුරාධපුරේ | යා |
| කෙලක් අනුසත සඟ සිටියේ | යා |
| මෙලක්සනෙන් ආරාම පෙලේ | යා |
| දොළක් ඇත්ද වඳිනට අපගේ | යා |
| | |
| පැතුං පතාගෙන යංනට බැරි | තැන |
| සිතිං සිතාගෙන වඳිමුව සැම | තැන |
| උතුං ත්‍රිවිධ රත්නය මුල්කර | ගෙන |
| සිතිං සිතාගෙන වඳිමුව සැම | තැන |
| | |
| සාර අසංකය පෙරුං පුරන් | ටයි |
| පාරමිතාවට මං පැමිණෙන් | ටයි |
| දාර අඹුං වස්තුව දං දෙන් | ටයි |
| මාර පරාජය කර බුදු වෙන් | ටයි[15] |

මෙම පද්‍ය පංතියෙන් බුදුන් වැඳීම ආරම්භ වෙයි. දෙවනුව ට ඇති පාලි පාඨය බුද්ධ, ධම්ම, සංඝ යන තුනුරුවන් ද බුදුන් වහන්සේගේ ධාතූන් ද පිහිටි ලංකාවේ, දඹදිව, තිදසපුර සහ නාග ලෝකයේ ද ඇති සියලු ස්තූප වන්දනාව සිහිපත් කරයි. එහි ඇති 'හිංබෙ' යනු 'බිම්බ' යන්න අදහස් කරයි. ඒ පිළිමවලට තවත් නමකි.

තෙවනුවට ඇති පද්‍යයෙන් අටවිසි බුදුවරු පිළිවෙළට නිවැරදි ලෙස කියා බෝධිය වන්දනා කරමු යන්න කියයි. තන්නංකර, මේධංකර, සරණංකර, දීපංකර ආදී වූ අටවිසි බුදුවරු වෙනුවෙන් ඇති අටවිසි පිරිත,

තන්නංකරෝ මහාවීරො
මේධංකරෝ මහායසෝ
සරණංකරො ලෝකහිතො
දීපංකරො ජුතින්දරෝ .......

වශයෙන් අදත් බෝධි පූජා අවසානයේ දී සැදැහැතියේ සජ්ඣායනය කරති. මෙහි ඇති අවසන් පද්‍ය තුනෙන් අනුරපුරේ වඳින්නට යාමත් ත්‍රිවිධ රත්නය මුල්කරගෙන සියලු ම තැන් වඳිමු යන්නත් සඳහන්වෙන අතර අවසාන කවියෙන් පාරමිතා පුරා තිබෙයි. ඒ අනුව මාර පරාජය කර බුදුවෙන්නට ප්‍රාර්ථනාවක් සිදුකර තිබෙයි. මෙකී පිටපත් අයිතිකරුගේ නම ද මෙහි සඳහන් වෙයි. එනම් "බාශගල පිංචා" යන්න යි. එහි ම බුද්ධ වන්දනාව කියා ද තිබෙයි. බෝධි වන්දනාව සහ බුද්ධ වන්දනාව යන වන්දනා ගාථා ඇතුළත් පුස්කොළ පිටපතකි. කාලයක් දැක්විය නොහැකි වුවත් ලේඛනයේ ස්වභාවය අනුව වසර 200ක් ඉක්මවා ඇත.

15 SILVA, 1938, P. 140 .

සිරිමා බෝ වැඳීම යටතේ තවත් තල්පත් ඉරු සතරක එකතුවක ආරම්භක පද්‍ය මෙසේ ය.

මෙලෙසින් මුනිඳු දම් රුක්මට වැඩි බෝ
රටේ බෝධි මණ්ඩලයට වැඩි බෝ
උතුන් අනුරපුරයේ පිහිටු බෝ
නිකිනි මාසෙ වඳිමුව සිරිමා බෝ

අවසාන පද්‍ය මෙසේ ය,

බසක් කියා අඬගෑ නැතිව යෙම්මා
රසක්වත් දෙයක් සඟනට දන් දෙම්මා
වෙසක් ඉසුරු රජ සම්පත් ලබම්මා
වෙසක් මාසේ දෙපොද බුදු වන්නි අම්මා[16]

නිකිනි මාසේ සිරිමා බෝ වඳින්නට ගිය පිරිසක් හා සම්බන්ධ කවි පංතියකි. සුර නර දෙපිරිසට දෙව්ලොව සැප ගෙන දෙන කප්රුකක් වශයෙන් ශ්‍රී මහා බෝධිය ඇගයීමට ලක්කළ වන්දනාකරුවෙකුගේ කවියක් මෙසේ ය.

සුර නරනා නො මද
දෙලෝ සැපදෙන සිතු ලෙද
කප්තුරුවන් එ සොඳ
සසිරි මා බෝ සපිරිවර ලද[17]

බෝධි වන්දනාව පිණිස ඒ ඒ කාලවල දී ලියැවී ඇති පුස්කොළ පිටපත් තව ද තිබෙයි. ඇතැම් ඒවා අදාළ ස්ථාන තුළ තිබේදැයි සොයා බැලිය යුතුවෙයි. මේ අතරින් බෝධි වන්දනා කාව්‍ය යටතේ පුස්කොළ පිටපතක් ශ්‍රී මහාවිහාර පුස්තකාලය උඩමලුව - පූජනීය පෙදෙස අනුරාධපුර යටතේ වාර්තා වන්නේ ය.[18] බෝධිවන්දනා ගාථා, කඩදොර රජමහාවිහාරය තාපටවෙල පදියපැලැල්ල.[19] බෝධිවන්දනා ගාථා, බිංපොකුණ රජමහාවිහාරය ඇහැටුවැව, වයඹ.[20] බෝධිවන්දනා ගාථා, පේරාදෙණිය විශ්වවිද්‍යාල පුස්තකාලය.[21] බෝධිවන්දනා ගාථා, සිරිදේවමිත්ත පුස්තකාලය, මල්වත්ත මහනුවර.[22] බෝධිවන්දනා ගාථා, හපුගොඩ රජමහාවිහාරය අඹතැන්න, ම.ප.[23]

මෙයින් අවසානයට ඇති පිටපත අයත් විහාරස්ථානය මෙම ලියුම්කරුගේ දායක විහාරස්ථානයයි. මීට කලකට පෙර පුස්තකාල පොත් පිළිබඳ අදාළ විහාරාධිපති හිමිගෙන් විමසා සිටිය දී එම පොත් සියල්ල සොරු පැහැරගෙන ගොස් ඇති බව දැන

16 SILVA, 1938, P. 229.

17 ජයසේකර, ඩී. ඇස්. පරණ පුස්කොළ පොත හෙවත් සිව ආදිපාද චරිතය, ගොඩගේ නැවත මුද්‍රණය, කොළඹ, 2008, 23 පිට.

18 සෝමදාස, කේ. ඩී. ලංකාවේ පුස්කොළ පොත් නාමාවලිය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, කොළඹ 1959, 102 පිට,

19 එම, 89 පිට.

20 එම, 95 පිට.

21 එම, 98 පිට.

22 එම, 101 පිට.

23 එම, 101 පිට.

ගන්නට ලැබිණ.ඒ අනුව එකී පුස්කොළ පිටපත ඉන් අතුරුදන්ව ඇතැයි සිතිය හැකි ය. පොදු වශයෙන් බලන කල බෝධිවන්දනා කවි ලියා ඇත්තේ සිරිමහ බෝධීන් වහන්සේ මුල්කරගෙන ය. ඒවායෙන් බුද්ධ භක්තිය මෙන් ම බෝධිය පිළිබඳ සැලකිල්ල යම් ප්‍රමාණයක් ප්‍රකාශිත ය. ඒ ඒ සමයේ සිටි රචකයන්ගේ අදහස් අනුව ලියැවී ඇති එම පද්‍ය පන්තීන්ගෙන් සමකාලීන ජනශ්‍රැතියට අයත් ආගමික සංකල්පය දැනගැනීමට පුළුවන් වෙයි.

සිරි මා බෝ විස්තරය මැයෙන් කවි 75ක් සහිත පුස්කොළ පත්තිරු එකතුවක් බ්‍රිතාන්‍ය කෞතුකාගාර පුස්තකාලයේ හියුනෙවිල් එකතුවේ තිබෙයි.[24] අටමස්ථානයේ විස්තර ද ඇතුළත් මෙම පුස්කොළ පිටපත වසර දෙසීයක් පැරණි යයි හියුනෙවිල් සඳහන් කරයි. හියුනෙවිල් මෙම පිටපත් ලංකාවෙන් එකතුකර ඇත්තේ දැනට වසර 152ක් ඉහත දී ය. ඒ අනුව මෙම පිටපත දැනට වසර 350ක් ඉක්මවා තිබෙයි. එහි අන්තර්ගතය දැන ගැනීම සඳහා අදාළ පිටපත පරීක්ෂා කරගත යුතුවෙයි.

සිරිමහා බෝ හැල්ල නමින් පත්තිරු 47ක තවත් පුස්කොළ එකතුවක් එම කෞතුකාගාරයේ or6604 යටතේ වාර්තා වෙයි.[25]

සිරිමහ බෝධීන් වහන්සේ ප්‍රධාන අටමස්ථානය වන්දනාව පිණිස ගමන් කළ වන්දනාකරුවන් පිළිබඳ ව ක්‍රි. ව. 1871 සමයට අයත් පද්‍ය 43ක් සහිත පුස්කොළ එකතුවක් ද බ්‍රිතාන්‍ය කෞතුකාගාර පුස්තකාලයේ තිබෙයි.[26] එය ලියනු ලැබ ඇත්තේ මාතලේ සිට පැමිණීමක් සම්බන්ධවය. මන්දන්ඩාවෙල, අලුවිහාරය, දොරකුඹුර පසුකරමින් පැමිණි බවක් එහි සඳහන් ය. මෙම ස්ථාන කිහිපය ඇත්තේ මාතලේ නගරයත් පලාපත්වලත් අතර ය. විස්තර දැන ගැනීමට එම පිටපත ද පරිශීලනය කළ යුතු ව ඇත. මෙවැනි ම තවත් පුස්කොළ පිටපතක් එකී කෞතුකාගාරයේ තිබෙයි.[27] පද්‍ය 135ක් සහිත එහි ද වන්දනාකරුවන්ගේ ගමන් මග පිළිබඳ ව ස්ථාන නාම කිහිපයක් ම සඳහන් ය. ඒ අතර හලාවත, දැදුරුඔය, කලාඔය, තිසාවැව යන තැන් ය. මෙම වන්දනාකරුවන්ගේ ගමන් ආරම්භය හලාවත ප්‍රදේශයයි. එම අය මෙකී ගමනේ දී ස්නානය කළ තැන් අතර දැදුරුඔයත් කලාඔයත් තිසා වැවත් සඳහන් ය. ඒ අනුව අදාළ වන්දනා පිරිස හලාවත, පුත්තලම, කරුවලගස්වැව, පලුගස්යායවැව, නොච්චියාගම, බුලංකුලම වර්තමාන පණ්ඩුලගම ඔස්සේ තිසාවැව දෙසට පැමිණ තිබෙයි. එයින් ජලස්නානයකර ශුද්ධ නගරය වෙත පිවිස බෝධි වන්දනාව සහ අටමස්ථානය වැඳපුදාගෙන ඇති බව පෙනෙයි. එකී ගමනේ අතරතුර විස්තර දැන ගැනීමට ද එම පිටපත කියවීම අවශ්‍ය වෙයි.

සිරිමහ බෝ ඇතුළු අටමස්ථනය වන්දනාව පිණිස පැමිණි තවත් වන්දනාකාර පිරිසක් ගැන තොරතුරක් අටමස්ථාන කවි යටතේ වෙනත් පද්‍ය පංතියක විස්තර වෙයි.[28] පත්ඉරු හයකින් යුක්ත එම සිංහල පද්‍ය පංතියට අයත් පත් ඉරු අංකනයකර ඇත්තේ 'ක, කා' ක්‍රමයටයි. ඒ අනුව තරමක් පැරණි යැයි සිතිය හැකි ය. එහි පළමු පද්‍යයෙන් හා දෙවෙනි පද්‍යයෙන් වන්දනාකරුවන් පැමිණි මාර්ගයේ ස්ථාන තුනක් හෙළිවෙයි. ඒ මෙසේ ය.

---

24 **Sinhala Verse (Kavi)** . Ed. By P. E. P. Daraniyagala. Part 3. Ceylon Nationals Museums Manuscripts Series Vol. VI (1954) Colombo, 1954, P.74.

25 සෝමදාස, 1959, 185 පිට.

26 **Sinhala Verse (Kavi)**. Part 2, P. 32.

27 Ibid, P.100.

28 De Silva, 1938,P.131.

අලංකාරයට වන පස්මල් මහි මා
හුලං වේගයට එහි සුවඳ යෙයි හැ මා
ගිලං අයගේ පය රිදුමෙන් වේය ප මා
බලං නාවුලත් දැක ලේනදොර ග මා

පිඹුරු නා පොළොන් ගවරුන් ඇති මේ වනේ
ගැඹුරු දියතලා වැව ඇත සිය ගණ නේ
ඇඹුල් සහ නානු සැමදෙන යොදා ගෙ නේ
දඹුලු ඔය ළගදී කෙරුවේ ස්නා නේ

ඉහත පළමු පද්‍යයෙන් විස්තරවන ආකාරයට රෝගී අය නිසා ගමන ප්‍රමාද බව කියැවෙයි. එමෙන් එහි ඇති නාවුල සහ ලෙනදොර ගම්මාන පසු කරමින් වර්තමාන A9 මාර්ගයේ පැමිණි බව පැහැදිලි ය. ඉන් තව ද ඉදිරියට එන වන්දනාකරුවෝ පිඹුරු නයි පොළොන් ගවරුන් ඇති වනය ද ගැඹුරු වැව ද පසුකර දඹුල්ලට පැමිණෙති. අනුරපුරයට පිවිසෙන මහනුවර අනුරපුර මාර්ගයේ දඹුල්ල මංසන්ධියකි. එහි ම ඇති දඹුලු ඔය වන්දනාකරුවන්ගේ ජලස්නාන ස්ථානයක් බව ඉහත දෙවැනි කවියෙන් කියැවෙයි.

එකී කවියෙන් පෙනෙන පරිදි වන්දනාකරුවත් ස්නානයට පෙර ඇඹුල් සහ නානු භාවිතයෙන් ස්නානය කළ බව දක්නට ලැබෙයි. අනුරපුරයට තවත් සැතපුම් 35ක් දුරින් පිහිටි තැනක සිට මේ චාරිත්‍රය කිරීම අනුව වන්දනාකරුවන්ගේ භක්තිය මොනවට පැහැදිලි වෙයි. ශුද්ධ ස්ථානයකට පිවිසීමට ප්‍රථම (පන්සල්, විහාර, දේවාල ආදී) ඇඹුල් ගා ස්නානය කිරීමක් ඇතැම් විට කලාතුරකින් හෝ සිදුවන අවස්ථා දැක තිබෙයි. ඒ පුරාණ චාරිත්‍ර අනුව බව සිතිය හැකි ය. ඇඹුල් වශයෙන් මෙහි භාවිත කරනුයේ පුළුස්සාගත් දෙහි ගෙඩියකි. නානු සඳහා විවිධ ඖෂධ වර්ග භාවිත කරති. විශේෂයෙන් ම සිංහල අවුරුද්දේ තෙල් ඇඹුල් ගෑමේ සිරිත ප්‍රචලිතයි. දේශීය ඖෂධ වර්ගවලින් සාදාගන්නා නානු හිස ගැල්වීම අනුව ඇතැම් රෝගාබාධ දුරුව යයි. තෙත් කලාපයෙන් වියළි කලාපයට පිවිසීමට පෙර නානු ගා ස්නානය කෙළේ යැයි සිතිය හැකි ය. එසේ නොවන්නේ නම් අනුරපුර පූජනීය ස්ථාන වෙත පැමිණි වන්දනාකරුවෝ තවදුරටත් කිලිකුණු පහ ව යන්නට ඇඹුල් සහ නානු ගා ස්නානය කරන්නට ඇතැයි යන්න සිතීමට කරුණු තිබෙයි. මෙය එක්තරා ජනශ්‍රැතික ලක්ෂණයකි.

ඉහත දක්වන ලද අටමස්ථාන වන්දනා කවි පංතියේ අවසන් කවි දෙක මෙසේ ය.

සංචල නොයෙක් දුක් ගැමක් නොවදින් ට
පුන්සඳ ලෙසට මගෙ උවනත බබලන් ට
තුන්ලොව සතුන් හට මතු අග රජ වෙන් ට
මන්කළ පින් ශැම දෙවියො ඇර ගන් ට

මවුපිය ගුරුවරුං ශැම සියලු ඥතින් නේ
රරෞරව නරක ඔසුපත්වල කිරි සතු නේ
සිවුපා තිරිසතුන් කුරුකුහුඹු පලඟින් නේ
මෙවුකළ පින් අනුමෝදන් ශැම සිති නේ

සිරිමහ බෝ ප්‍රධාන අටමස්ථානය වන්දනා කළ අයගේ අවසන් ප්‍රාර්ථනය ඉහත කවි දෙකෙන් පෙනෙයි. සියලු දුක් නිවාරණය වී සුවපත්වීමත් තුන්ලොවට අගරජ වන්නටත් ප්‍රාර්ථනය කරන වන්දනාකරුවා බොහෝ දෙනෙකුට පින් අනුමෝදන් කරයි. ඒ අතර සියලු ම දෙවියෝ ද සිටිති. එයට අමතර ව සියලු නෑදෑයන්ටත් අපායවල දුක්විඳින තිරිසනුන්ටත් සිවුපාවුන්ටත් කුරුකුහුඹු පලගැටි යන සතුන්ටත් තමා කළ පින් අනුමෝදන් කරයි.

**නිගමනය**

මේ ආකාර පද්‍ය පන්ති තුළින් එවැනි වන්දනාකරුවන් ගේ සිතුවිලි භක්තිමත් ව ප්‍රකාශකර ඇත්දැයි වැටහෙයි. වර්තමානයේ තරම් දියුණු ගමන් මාර්ග හෝ ප්‍රවාහන පහසුකම් නොමැතිව දින ගණනාවක් පයින් හෝ ගොනු බැඳි කරත්තවලින් වනදුර්ග ගිරිදුර්ග ජලදුර්ග පසු කරමින් සිරිමා බෝ වන්දනාවට පැමිණි පිරිස කෙතෙක් දැයි නිශ්චිත නැත. ඉහත දක්වන ලද නිදසුන් අනුව කිසියම් ප්‍රමාණයක ගමන් විස්තර ගමන් මාර්ග සහ ජනශ්‍රැති ලක්ෂණ හඳුනා ගැනීමට පුළුවන් ය. වඩාත් විස්තර දැනගැනීම සඳහා අදාළ පුස්කොළ පිටපත් සම්පූර්ණ වශයෙන් අධ්‍යයනයට ලක්කිරීම මැනවි. ඉතා කෙටි කලක් තුළ සම්පාදනය කළ මෙම ලිපිය තුළින් සංඛේත වශයෙන් හෝ අදාළ කරුණු සම්බන්ධ ව තොරතුරක් ලබා ගැනීමට හැකි වේවායි යන්න අප ප්‍රාර්ථනයයි.